# දීපාවලී උත්සවයේ සමාජික, ආගමික සහ ආර්ථික වැදගත්කම

දුලානි පෙරේරා[1]

ශ්‍රී ලංකාවේ අසල්වැසි රට වන භාරතයේ ජීවත් වන ජනතාව වසර මුළුල්ලේ ම විවිධාකාරයේ උත්සව සමරති. විශාල වශයෙන් හින්දු භක්තිකයන් ජීවත් වන භාරතයේ එසේ සමරනු ලබන උත්සව අතරින් දීපාවලී උත්සවයට වැදගත් ස්ථානයක් හිමි වේ. 'දීප' සහ 'ආවලී' යන වචන ද්වයය සන්ධි වීමෙන් සෑදෙන 'දීපාවලී' යන්නෙහි අරුත 'පහන් පේළිය' යන්න යි. බෞද්ධ, සික්, ජෛන ආදි ආගම් රාශියක සඳහන් වන 'අඳුරෙන් එළියට' යන අරුත රැගත් 'තමසෝ මා ජ්‍යෝතිර්මය' යන්න පදනම් කරගෙන පවත්වන්නා වූ දීපාවලී උත්සවය 'ධන්තේරස්', 'චෝටී දීවාලී', 'දීවාලී', 'ගෝවර්ධන් පූජා', 'භෛයා දූජ්' ආදි විවිධ නම්වලින් හඳුන්වමින් භාරතයේ දින පහක් පුරා පැවැත්වෙයි. භාරතයේ වෙසෙන විවිධ බැතිමතුන් දීපාවලී උත්සවය විවිධාකාර වූ සමාජික සහ ආගමික වටිනාකම් පෙරදැරි ව ය. ඒ අතරින් රාම භක්තිකයන් රාම රජු තම වසර දහ හතරක වන වාසය නිමා කොට නැවත අයෝධ්‍යාවට පැමිණීමේ සතුටත්, ක්‍රිෂ්ණ භක්තිකයන් ක්‍රිෂ්ණ දෙවියන් විසින් කෲර පාලකයකු වූ නරකාසුර් විනාශ කර පැමිණීමේ සතුටත් සැමරීම මූලික අරමුණු කොටගෙන ඇත. මේ දිනයේ දී පවත්වනු ලබන 'බහිඛාතා' නම් පූජාව මෙහි ඇති ආර්ථික වටිනාකම මනාව පැහැදිලි කරන්නකි. දීපාවලී දිනයේ දී 'බහිඛාතා පූජාව' පැවැත්වීම මඟින් ඔවුහු ධනයට අධිපති ලක්ෂ්මී දේවියට තමන්ගේ නිවෙස්වලට ආරාධනා කිරීමට බලාපොරොත්තු වෙති. එයින් සංකේතවත් වන්නේ ඔවුන්ගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා දීපාවලී උත්සවය වැදගත් වන බව යි. මේ දිනයේ දී රසවත් ආහාර පිසින භාරතීය ජනයා ඒ ආහාර තම හිතවතුන් සමඟ ද බෙදාහදා ගනිමින් සතුට සමරති. භාරතයේ පැවැත්වෙන අනෙකුත් බොහෝමයක් උත්සව ආගම පමණක් පදනම් කොටගෙන පැවැත්වුවත් දීපාවලී උත්සවය සමාජික, ආගමික සහ ආර්ථික අරමුණු පදනම් කරගෙන පැවැත්වේ. ඒ නිසා දීපාවලී උත්සවයේ ඇති මෙකී සමාජික, ආගමික සහ ආර්ථික වැදගත්කම පිළිබඳ සොයාබැලීම මේ පර්යේෂණයේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද:** දීපාවලී උත්සවය, භාරතීය ජනතාව, සමාජික, ආගමික සහ ආර්ථික අරමුණු

[1] හින්දි අධ්‍යයන අංශය